www.wsws.org

# ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ආන්ඩුව ඇතුලත බෙදීම් පුපුරා යයි

Divisions erupt within Sri Lankan government

කේ. රත්නායක විසිනි

2018 ඔක්තෝබර් 20

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන ඔක්තෝබර් 16 දා පැවති කැබිනට් රැස්වීමේ දී "ඉන්දියානු ඔත්තු සේවය" තමන් ඝාතනය කිරීමට සැලසුම් කරමින් සිටින බවට ප්‍රකාශ කල බවට පලකෙරුන මාධ්‍ය වාර්තා හේතුකොටගෙන කොලඹ හා නව දිල්ලිය අතර දේශපාලන කලබගැනියක් නිර්මානය කර ඇත.

සිරිසේන මෙම අදහස් දැක්වීම කල බව ප්‍රතික්ෂේප කර ඇත. කෙසේ වෙතත්, කලායයි සැලකෙන ප්‍රකාශයන් ට දක්වා ඇති ප්‍රතිචාරය මගින් සභාග ආන්ඩුවේ පාර්ශවකරුවන් වන සිරිසේනගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ (ශ්‍රීලනිප) කන්ඩායම හා අගමැති රනිල් වික්‍රමසිංහගේ එක්සත් ජාතික පක්ෂය (එජාප) අතර ගැටුම් එලිමහනට ගෙනැවිත් තිබේ.

සිරිසේන කල බව කියන ප්‍රකාශය සම්බන්ධව ඇවිල ඇති මතභේදය එලිමහනට පැමින ඇත්තේ , තීව්‍ර කෙරෙන ආර්ථික ගැටලු තුල ආන්ඩුව වඩවඩා කිඳී යන්නා වුත් සහ බෙහෙවින් ම, ජනතා අප්‍රසාදයට ලක්ව ඇති එහි කප්පාදු පියවරයන්ට එරෙහි සමාජ විරෝධය වැඩෙන්නාවුත් තත්වයකය. අන් සියල්ලට මත් වඩා ආන්ඩුවේ ගැඹුරු වන අර්බුදය සම්පව බැඳී තිබෙන්නේ, එක් පසෙකින් ඉන්දියාව හා එක්සත් ජනපදය ද, අනෙක් පසින් චීනය ද අතර වර්ධනය වන භූ-දේශපාලනික ප්‍රතිමල්ලවතාව සමග ය.

පාලක සභාගයේ මන්ත්‍රී බහුතරය හිමිව තිබෙන්නේ වික්‍රමසිංහගේ එජාපයට ය. සිරිසේනට පක්ෂව සිටින්නේ ශ්‍රීලනිප මන්ත්‍රීවරුන් දුසිම් දෙකක් පමනි. ශ්‍රීලනිපයේ පාර්ලිමේන්තු සභිකයන්ගෙන් බහුතරයක් පෙලගැසී සිටින්නේ සිරිසේනගේ ප්‍රධාන විරුද්ධවාදියා වන හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ සමග ය. රාජපක්ෂට සහයෝගය ප්‍රකාශ කරමින් පසුගිය මාසයේ ශ්‍රීලනිප මන්ත්‍රීන් දහසයක් ආන්ඩුවෙන් ඉවත් වූහ.

කලින් දින කැබිනට් රැස්වීමක දී "ඉන්දියානු ඔත්තු සේවය" ඔහු ව "ඝාතනය කිරීමට උත්සාහ දරමින් සිටින" බවට සිරිසේන ප්‍රකාශ කලේ යයි සඳහන් වාර්තාවක් ඔක්තෝබර් 17 දින ප්‍රමුඛ පෙලේ ඉන්දියානු පුවත්පතක් වන *ද හින්දු* පත්‍රයෙහි පල විය. වාර්තාවන ආකාරයට ඉන්දියානු අගමැති නරේන්ද්‍ර මෝදි "එම සැලසුම ගැන නො දන්නවා විය හැකි" යයි සිරිසේන ප්‍රකාශ කර ඇත. ශ්‍රී ලංකාවේ මාධ්‍ය ද මෙම ප්‍රකාශයන් පල කලේ ය.

මෙම වාර්තා නව දිල්ලිය සමග ඝර්ෂනයන් ඇතිකරනු ඇතැයි තැතිගත් සිරිසේන, එවැනි අදහසක් පල නො කල බව කීමට ඔහු ඔක්තෝබර් 17දා මෝදිට දුරකථනයෙන් කතා කලේ ය. චීනය සමග ගැටුමේ කොටසක් ලෙස ශ්‍රී ලංකාව සමග බලගතු මුලෝපායික බැඳීම් ඇති කරගැනීම පිනිස එක්සත් ජනපදය ද සමගින් ඉන්දියාව ප්‍රයත්නයක යෙදී සිටී.

සිරිසේන මාධ්‍ය වාර්තා "අවධාරනාත්මක ව ප්‍රතික්ෂේප කල" බව පුනරුච්චාරනය කරමින් ඉන්දීය විදේශ අමාත්‍යාංශය ප්‍රකාශයක් නිකුත් කලේ ය. මෙම චෝදනා "දුෂ්ට හා ව්‍යාජ" බවත්, ඒවා ඔහු හා මෝදි අතර "වැරදි අවබෝධයක් නිර්මානය කිරීම" හා "මිත්‍රශීලී අසල්වැසියන් දෙදෙනා අතර සුහද සබඳතාවන්ට" හානි කිරීම ඉලක්ක කරගත්තක් බවත් සිරිසේන වාර්තාකරුවන්ට සඳහන් කලේ ය.

ප්‍රකාශයන් වාර්තා කල මාධ්‍ය ඔවුන්ගේ ප්‍රවෘත්තිය ආරක්ෂා කරයි. ප්‍රධාන මාධ්‍ය බොහොමයක්ම තරගවැදී සිටින දේශපාලන කන්ඩායම් සමග පෙලගැසී සිටී.

සිරිසේන ඝාතනය කිරීමේ සැලැස්මක් ගැන පසු ගිය මාසයේ පැවති මාධ්‍ය හමුවක දී ප්‍රථමයෙන් සඳහන් කලේ පොලිස් ඔත්තුකාරයෙකු වන නාමල් කුමාර විසිනි. සිරිසේන ඝාතනය කිරීමේ සැලසුමක් ගැන ශ්‍රී ලංකාවේ නියෝජ්‍ය පොලිස්පතිවරයෙක් වන නාලක ද සිල්වා තමන් සමග ප්‍රකාශ කල හ!පටයක් තමන් සතුව ඇතැයි කුමාර ප්‍රකාශ කලේ ය.

මෙම කුමන්ත්‍රනයට ඉන්දියානු ජාතිකයෙකු ද සම්බන්ධ බව කුමාර පැවසීය. පොලිසිය පසුව එම්. තෝමස් නමැති ඉන්දියානු ජාතිකයා අත්අඩංගුවට ගෙන රඳවා ගත් හ. ඔහු "මානසික රෝගියෙකු" බව ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය පවසා තිබේ.

දූෂන-විරෝධී ව්‍යාපාරයක නායකයෙකු ලෙස ද පෙනී සිටින කුමාර සැකකටයුතු පුද්ගලයෙකි.

සිල්වා ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය භාරව සිටි තැනැත්තා ය. ආන්ඩුව ඔක්තෝබර් 17 වෙනි දා සිල්වාගේ වැඩ තහනම් කලේ ය. ඔහු හා කුමාර යන දෙදෙනා පිලිබඳ ව ම අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව විමර්ශන පවත්වමින් සිටී.

ජනාධිපතිවරයා හා මෝදි අතර සබඳතාවන්ට "හානි කිරීමට" *ද හින්දු* පත්‍රයට ව්‍යාජ තොරතුරු දීම ගැන සිරිසේන හිතවාදියෙක් වන වරාය හා නාවික ඇමති මහින්ද සමරසිංහ 18 වෙනි දා ඇමතිවරුන්ට චෝදනා කලේ ය. සමරසිංහ ඇමතිවරුන් ව නම් නො කලත් ඇඟවුම් කලේ ඔවුන් එජාපයේ අය බව ය.

එජාපය ගැන ඉඟි කරමින්, ආන්ඩුව ඝාතන සැලසුම ගැන විමර්ශනය කිරීමට උනන්දු නැති බව 18 වෙනිදා පැවති වෙනත් මාධ්‍ය හමුවක දී ජනාධිපතිගේ මාධ්‍ය උපදේශකයෝ සඳහන් කලහ. ජනාධිපතිවරයාගේ අනුමැතියකින් තොර ව මෙම ප්‍රකාශයන් කල නො හැකි ය.

කුමන්ත්‍රනයක් පිලිබඳ ව කුමාරගේ ප්‍රකාශයන් ඔප්පු කිරීමට "ප්‍රමානවත් තරම් සාක්ෂි" නැති බව කැබිනට් ප්‍රකාශක හා සෞඛ්‍ය ඇමති රාජිත සේනාරත්න පෙර දින පැවති මාධ්‍ය හමුවක දී සඳහන් කලේ ය.

සිරිසේන හා වික්‍රමසිංහ අතර නොඑකඟතාවන්ට වැඩකරන ජනයාගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සමග කවර හෝ සම්බන්ධයක් නැත. ඒවා පවතින්නේ සංගත ප්‍රභූවේ අවශ්‍යතා වඩා හොඳින් ක්‍රියාත්මක කරන්නේ කෙසේ ද යන්න අරබයා ය.

2015 ජනවාරි මැතිවරනයේ දී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ බලයෙන් පහ කරමින් සිරිසේන බලයට පත්විය. කලින් ආන්ඩුව ප්‍රජාතාන්ත්‍රික අයිතීන් මත එල්ල කල ප්‍රහාර,

එහි කප්පාදු පිලිවෙත් හා බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට එරෙහි යුද්ධයේ දී කල අපරාධ පිලිබඳ ව කම්කරුවන් හා දුගීන් අතර පැවති පුලුල් විරෝධය සිරිසේන විසින් ගසාකෑවේ ය.

එක්සත් ජනපදය හා ඉන්දියාව කොලඹ තන්ත්‍ර මාරුවට පිටුබලය දුන් හ. එම රටවල් දෙක ම රාජපක්ෂට බීජිනය සමග පැවති සබඳතාවන්ට හතුරු විය. බලයට පත් වහා ම ආන්ඩුව වොෂින්ටනය සමග ශ්‍රී ලංකාවේ පෙලගැසීම ශක්තිමත් කරන බව සිරිසේන සංඥා කලේ ය.

එහෙත් කඳුගැසෙන නය ගැටලු ද ඇතුලු ගැඹුරු වන ආර්ථික අර්බුදයක් මධ්‍යයේ මූල්‍ය ආධාර පතා චීනය වෙත හැරීමට සිරිසේන-වික්‍රමසිංහ ආන්ඩුවට බලකෙරී තිබේ.

චීනය සමග වන එක්සත් ජනපද යුද සැලසුම්වල තීව්‍ර වීමක් සටහන් කරමින් පසුගිය මාසයේ උප ජනාධිපති මයික් පෙන්ස් කල යුදවාදී කතාවක දී "චීන නය උගුල් රාජ්‍යතාන්ත්‍රිකත්වයට" උදාහරනයක් ලෙස ශ්‍රී ලංකා ආන්ඩුව විසින් හම්බන්තොට වරාය චයිනා මර්චන්ට්ස් පෝට් හෝල්ඩිංස් සමාගමට පැවරීමේ ගනුදෙනුව ගෙනහැර දැක්වී ය.

වරායක් ඉදිකිරීම සඳහා චීන රාජ්‍ය සමාගම්වලින් විශාල ලෙස ශ්‍රී ලංකාව නය ගත් බව පෙන්ස් ප්‍රකාශ කලේ ය. "වසර දෙකකට පෙර තම ගෙවීම් තව දුරටත් දරාගත නො හුනු එම රට නව වරාය කෙලින් ම, චීනයේ අතට පත් කල" බව ඔහු සඳහන් කලේ ය. පෙන්ස්ගේ ප්‍රකාශයන් ගෙන් අවධාරනය කෙරුනේ දිවයින මත චීනයේ බලපෑම කෙරෙහි එක්සත් ජනපදයට පවතින අත්‍යන්ත විරෝධය යි.

අත්‍යවශ්‍ය භාන්ඩ මිල ඉහල දමමින් හා සහනාධාර, සෞඛ්‍ය සහ අධ්‍යාපනය සඳහා සමාජ වියදම් කප්පාදු කරමින් අයවැය පරතරය අඩු කිරීම අඩංගු රුදුරු කප්පාදු වැඩපිලිවෙලකට ගැටගැසුනු නයක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් (ජාමුඅ) ගැනීමට ද ආන්ඩුවට බලකෙරී ඇත.

මෙම ප්‍රහාර දුම්රිය, තැපැල් හා වරාය කම්කරුවන් සහ ගුරුවරුන්ගේ සමාජ අරගල මාලාවක් පැනනංවා තිබේ. සිසුහු අධ්‍යාපනය පුද්ගලීකරනයට එරෙහි ව අඛන්ඩ විරෝධතාවල නිරත ව සිටිති. සහනාධාර කප්පාදුවට විරුද්ධ ව ගොවි හා ධීවරයන් අරගලවලට පිවිසෙමින් ඇත. වතු කම්කරුවෝ 200,000 ක් පමන සියයට සියයක වැටුප් වැඩිවීමක් ඉල්ලමින් විරෝධතාවන්හි යෙදෙති.

ව්‍යාජ-වාම කන්ඩායම්වල ද පිටුබලය ලබන වෘත්තීය සමිති, මෙම අරගල ආන්ඩුව සමග දේශපාලන ගැටුමක් බවට වර්ධනය වීමෙන් වැලැක්වීමේ මූලික භූමිකාවක් ඉටුකරයි.

පසුගිය පෙබරවාරියේ පැවති පලාත් පාලන මැතිවරනයේ දී ද ආන්ඩුව කෙරෙහි වර්ධනය වන අප්‍රසාදය ප්‍රකාශයට පත් විය. ආසනවලින් බහුතරයක් රාජපක්ෂගේ පාර්ශවය විසින් ජයග්‍රහනය කල අතර සිරිසේනගේ ශ්‍රීලනිපය තෙවැනි තැනට පත් ව එජාපය දෙවන තැනට වැටුනි.

මේ වසර තුල ශ්‍රී ලංකා රුපියල සියයට 11කින් අවප්‍රමානය වී තිබෙන තතු තුල, ආන්ඩුව මූල්‍ය අර්බුදයකින් ද වෙලාගෙන ඇත. මෙය වනාහි ඉන්දියාව, පාකිස්තානය හා අනෙකුත් ඊනියා නැගී එන වෙලඳපොලවල් අලලාගත් ප්‍රවනතාවක කොටසකි.

ආර්ථික අර්බුදය "වඩා නරක අතට හැරෙමින්" තිබෙන බව පිලිගනිමින් "සියලු පක්ෂ දේශපාලන බේද අතහැර දමා මෙම අර්බුදය ජයගැනීම සඳහා ආන්ඩුවට සහයෝගය දෙනු ඇතැයි" තමන් අපේක්ෂා කරන බව වික්‍රමසිංහ පසුගිය සතියේ ප්‍රකාශ කලේ ය.

තමන්ගේ ම ආන්ඩුවේ කප්පාදු පිලිවෙත්වලින් දුරස්ථ වීමට සිරිසේන කුහක ලෙස උත්සාහ කරයි. වැඩෙන ආර්ථික ගැටලුවලට ප්‍රධාන හේතුව දූෂනය බව ප්‍රකාශ කර ඇති ඔහු ඇමතිවරුන් හා රාජ්‍ය නිලධාරීන් ව ප්‍රසිද්ධියේ විවේචනය කර ඇත. දූෂනය පිලිබඳ චෝදනා එල්ල කරමින් ලංකා බැංකුවේ හා මහජන බැංකුවේ අධ්‍යක්ෂ මන්ඩලවලට ඉල්ලා අස්වන ලෙස මේ සතියේ, ඔහු විධාන කලේ ය. එජාප ඇමතිවරුන් මෙම පියවරට විරෝධය පලකර ඇත.

වැඩෙන සමාජ කෝපය ප්‍රතිගාමී දිශා ඔස්සේ අපසරනය කිරීම පිනිස ජාතිකවාදය දිරිමත් කිරීමට ද සිරිසේන කැසකවමින් සිටී.

කොලඹ වරායේ නැගෙනහිර පර්යන්තය ජාතික වරාය අධිකාරිය විසින් සංවර්ධනය කිරීම ඉල්ලා සිටින කැබිනට් පත්‍රිකාවක් මේ සතියේ කැබිනට් රැස්වීමට නාවික ඇමති සමරසිංහ විසින් ඉදිරිපත් කලේ ය. ආන්ඩුව දැනට මත් ඉන්දියානු ආයෝජන සහිත ව එම පර්යන්තය සංවර්ධනය කිරීමට එකග වී ඇතැයි කියමින් වික්‍රමසිංහ එම යෝජනාවට විරුද්ධ විය. වරායවල් එලෙස පැවරීම රටෙහි ස්වෛරීත්වයට හානිකර යයි සිරිසේන ප්‍රකාශ කලේ ය.

තමන්ට "වික්‍රමසිංහ සමග වැඩ කල නො හැකි" බව ප්‍රකාශ කල සිරිසේන, "භාරකාර ආන්ඩුවක්" ස්ථාපනය කිරීම පිනිස රාජපක්ෂ සමග එකගතාවක් ඇති කරගැනීමට පවා උත්සාහ කලේ ය. ඔවුන් දෙදෙනා පසු ගිය මාසයේ රහසිගත සාකච්ඡාවක් පැවැත්වූ බව මාධ්‍ය වාර්තා කලේ ය. රාජපක්ෂ හෝ සිරිසේන මෙම වාර්තා ප්‍රතික්ෂේප කර නැත. එහෙත්, පෙනෙන ආකාරයට රාජපක්ෂගේ ඉලක්කය ආන්ඩුවේ අර්බුදය ගසා කා තමන් නායකත්වය දෙන ආන්ඩුවක් පිහිටුවීම ය.

*ද හින්දු* පත්‍රය සමග පසුගිය මාසයේ පැවති සම්මුඛ සාකච්ඡාවක දී රාජපක්ෂ මෙසේ සඳහන් කලේ ය:

"ආන්ඩුවක් ශක්තිමත් තනි හඬක් නැගිය යුතු ය". කොලඹ "ස්ථාවර ආන්ඩුවක්" නැති හෙයින් ආයෝජකයන් ආපසු හැරී යන බවට ඔහු අනතුරු ඇඟවී ය. සිංහල ස්වෝත්තමවාදී කන්ඩායම් රැලි කරගනිමින් සිටින රාජපක්ෂ, ආන්ඩුව "රනවිරුවන්" දඩයම් කරන බවට චෝදනා කරමින් මිලිටරියට ආයාචනා කරයි.

ඉන්දියාව හා එක්සත් ජනපදය සමග සබඳතා ගැඹුරු කිරීම අවශ්‍ය බව පාලක ප්‍රභූවේ තරග වැදී සිටින සියලු කන්ඩායම් ඇගවුම් කර ඇත.

ලංකාව තුල ඉන්දියානු ආයෝජන පිලිබඳව මෝදි සමග සාකච්ඡා කිරීමට 18දා වික්‍රමසිංහ නව දිල්ලියට ගියේ ය.

රාජපක්ෂ සැප්තැම්බර් මාසයේ නව දිල්ලියට සංචාරය කලේ අනාගතයේ ඔහු ආන්ඩුවක් පිහිටවුවහොත්, ඒ සඳහා ආශීර්වාද ලබාගැනීමට ය.

ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්ථාපිතය තුල ගැටුම් ප්‍රකාශයට පත්කරන්නේ ධනේශ්වර පාලනයේ ගැඹුරු වන අර්බුදයකි. තරග වැදී සිටින සෑම කන්ඩායමක් ම ගනන් බලමින් සිටින්නේ, ප්‍රධානබලයන් සමග පෙල ගැසෙමින් ධනපති පන්තියේ අවශ්‍යතා වඩා හොඳින් ක්‍රියාවට දමන්නේත් වැඩකරන ජනයාට එරෙහි ප්‍රහාරය තීව්‍ර කරන්නේත් කෙසේ ද යන්න පිලිබඳ ව ය.

මෙම වර්ධනයන්ගැන අවධාරනය කෙරෙන්නේ කම්කරුවන්ට ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා කරගත හැක්කේ කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් ස්ථාපනය කිරීම ඉලක්ක කරගත් ජාත්‍යන්තරවාදී හා සමාජවාදී ක්‍රියාමාර්ගයක් වෙත හැරීමෙන් පමනක් බව යි. මෙම ක්‍රියාමාර්ගය ඉදිරිපත් කරන්නේ සමාජවාදී සමානතා පක්ෂය පමනි.

© www.wsws.org